# මාතර ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය

---

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අගෝස්තු 26 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 23 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට මාතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනට හිඟහිටි වෙනත් ආදායම් එකතුව රු.61,201,915 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ආරම්භක වටිනාකම රු.61,680,564 ක් ලෙසට දක්වා රු.478,649 ක මුදලක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) (i) සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,762,296 ක් වූ අතැති තොගය වර්ගීකරණයකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ගතකර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට රු.46,812 ක් වටිනා වීපී පහන් හා ඉන්ධන තොගයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ නොගෙවූ වැටුප් හා වේතනවල වටිනාකම රු.49,276 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල වර්ගීකරණයකින් තොරව වියදම් ණයහිමියෝ යටතේ ගිණුම්ගතකර තිබුණි. පසුගිය වර්ෂයේදීද පෙන්වා දුන් මෙම අඩුපාඩුව සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභා මායිම් තාප්පය ඉදිකිරීමේ රඳවුම් මුදල් ලෙසට කැකනදුර ගොවි සංවිධානයට ගෙවිය යුතු රු.134,714 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල ණයහිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව රු.10,112 ක් වූ සභාවේ සේවක ඇප ආයෝජන වල වටිනාකම ආපසු ගෙවිය යුතු තැන්පතු වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) 2013 මැයි 23 දින නව ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය වෙනුවෙන් ගෙවා තිබූ රු.20,000 ක අත්තිකාරම් මුදලින් වැය නොකර ඉතිරි වූ රු.7,221 ක මුදල 2013 මැයි 29 දින 93199 දරන ලදුපත මගින් පියවා තිබූ අතර රු.12,779 ක වියදම ගිණුම් ගත නොකර පෙර ගෙවුම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.1,632,428 ක් වූ විශ්‍රාම වැටුප් දායක මුදල සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඌ) ඉකුත් වර්ෂය සඳහා උසාවි දඩ මුදල් වෙනුවෙන් ඇස්තමේන්තුකළ මුදල රු.360,000 ක් වූ අතර තථ්‍ය වශයෙන් ලැබී ඇති මුදල රු.286,818 ක් විය. ඒ අනුව රු.73,182 ක අධි වෙන්කිරීම් සඳහා ජර්නල් සටහන් මගින් ගිණුම් ගැලපීම් කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු අක්කර බදු ආදායම රු.11,238 ක මුදල අක්කර බදු ලේඛනයේ සඳහන් වුවද, මූල්‍ය ප්‍රකාශනවල ආදායම් ණයගැතියෝ යටතේ ගිණුම්ගතකර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ තැන්පතු ලේඛන වලට අනුව රු.8,810,065 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාල තැන්පතු වටිනාකම ආපසු ගෙවිය යුතු තැන්පත් ලෙසට මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගතකර නොතිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම

සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 06 කට අදාලව වටිනාකම රු.10,054,436 ක් වූ අතර උපලේඛන අනුව වටිනාකම රු.6,812,335 ක් වූයෙන් වෙනස රු.3,242,101 ක් විය

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.1,955,004 ක් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 68,630,300 ක් විය.

1.3.5 නිරවුල් නොකළ ගිණුම්

රු. 34,276,293 ක් වූ ගිණුම් ශේෂයන් 07 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.41,421,111 ක් වටිනා ගිණුම් විෂයයන් 07 කට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

1.3.7 නීති, රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2002 නොවැම්බර් 28 දිනැති අංක 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිසනක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ආ) 2005 මාර්තු 31 දිනැති අංක 08/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දේපල ණය පිළිබඳ සංශෝධනය කිරීමේ චක්‍රලේඛයේ 11.5 වගන්තියෙහි "දේපළ ණය සඳහා බැංකු පොලී අනුපාතය හා නිලධාරියාගෙන් අයකරන සියයට 4.2 ක පොලී අනුපාතය අතර වෙනස රජය විසින් දරනු ඇත" යන්න දක්වා තිබුණි. ඒ අනුව නිලධාරීන් 11 දෙනෙකු ලබාගෙන තිබූ ණය වෙනුවෙන් සභා අරමුදලෙන් ගෙවා තිබූ රු.111,506 ක මුදල 2014 අගෝස්තු 14 දින වන විටත් ප්‍රතිපූර්ණය කරවා ගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.2,421,337 ක් වූ අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,296,972 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| --- | --- | --- | --- |
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් බදු | 1,510 | 327 | 697 |
| කුලී මුදල් | 4,313 | 1,294 | 1,129 |
| බලපත්‍ර ගාස්තු | 1,799 | 834 | 76 |
| වෙනත් ආදායම් | 51,874 | 35,909 | 96,644 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

(අ) වරිපනම් බදු

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟහිටි වරිපනම් බදු වටිනාකම රු.817,999 ක් වූ අතර වර්ෂය තුල බිල්කිරීම් රු.298,089 ක් සමඟ සමාලෝචිත වර්ෂයට අයවිය යුතු මුදල රු.1,116,088 ක් විය. වර්ෂය තුල එකතු කර ගන්නා ලද මුදල රු.540,185 ක් වූයෙන් අයවීමේ ප්‍රතිශතය සියයට 48 ක් වී තිබුණි. තවද ආදායම් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(ඇ) වගන්තිය අනුව ආදායම් අයකිරීමේ බලධාරියා වන සභාවේ ලේකම්වරයාගේ අවධානය යොමුවී නොතිබුණි.

(ආ) කුලී මුදල්
-----------
සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟහිටි කුලී මුදල රු.1,129,898 ක් වූ අතර වර්ෂය තුල බිල්කිරීම් රු.834,618 ක් සමඟ සමාලෝචිත වර්ෂයේ අයකර ගතයුතු මුදල රු.1,964,516 ක් විය. වර්ෂය තුල අයකරගත් මුදල රු.959,226 ක් වූයෙන් අයකර ගැනීමේ ප්‍රතිශතය සියයට 48 ක් විය.

(i) සභාවේ කඩ කාමර කුලී අයකිරීමේදී කැකනදුර ස්වර්ණ පුරවර කඩ කාමර 07 ක් සඳහා 2005 වර්ෂයේ තක්සේරු කළ කුලී මුදලින් සියයට 35 ක් කපා හැරීමට 2012 ජූනි 28 දින මහා සභා රැස්වීමේදී තීරණය කර තිබුණි.

(ii) කැකනදුර ස්වර්ණපුරවර කඩකාමර වලින් රු.43,875 ක්ද, කැකනදුර කර්මාන්ත පුරයේ ඉඩම් බදුදීම් වලට අදාලව සමාලෝචිත වර්ෂයට හිඟහිටි මුදල රු.23,100 ක්ද විය.

(iii) 2005 වර්ෂයේ කඩා ඉවත් කරන ලද කඩ කාමර 04 කින් රු.300,335 ක හිඟහිටි මුදලක් අය කිරිමට තිබුණද එම හිඟ මුදල් අයකර ගෙන නොතිබුණි.

(iv) හිඟ කඩකුලී සම්බන්ධයෙන් කීර්ති මුණසිංහ මහතාට එරෙහිව පවරා තිබූ අංක 9254 දරන නඩුවේ තීන්දුව අනුව කඩකුලී හා දඩ මුදල වශයෙන් රු.116,313 ක මුදලක් අයකරන ලෙස සඳහන්ව තිබුණද එකී මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-----------------------------
පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (අ) | උසාවි දඩ | 433,181 |
| (ආ) | මුද්දර ගාස්තු | 10,711,976 |

3. මෙහෙයුම් සමාලෝචනය
------------------------------
3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

3.1.1 තාවකාලික වැසිකිලි හා නාන කාමර තැනීම
-----------------------------------------------
පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2011 සැප්තැම්බර් 06 දිනැති ලිපියට අනුව උක්ත යෝජනාව ඉටුකර අවශ්‍ය ප්‍රතිපාදන බන්ධනාගාර හා පුනරුත්ථාපන ගරු අමාත්‍යවරයා වෙතින් හෝ සභා අරමුදලින් දැරිමට අනුමත කර තිබුණි.ඒ අනුව එකී වැඩය සඳහා මාකාවිට සමෘද්ධි බලකාය සමඟ ගිවිසුම් අත්සන් කර 2012 සැප්තැම්බර් 06 දින රු.92,101 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණද 2014 අගෝස්තු 20 දින වන විටද මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.1.2 හඳුනාගත් අලාභ
-------------------
සභාව මගින් නඩත්තු කරනු ලබන ආර්ට්ගෝල් කායවර්ධන මධ්‍යස්ථානය සම්බන්ධයෙන් වූ 2013 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ආර්ට්ගෝල් කායවර්ධන මධ්‍යස්ථානයට නිකුත් කර තිබුණු භාණ්ඩ අයිතමයන් 14 ක් සම්බන්ධව ඌනතාවයන් ඇති බව වාර්තා කර තිබුණද එකී ඌනතාවයේ වටිනාකම ගණනය කර වගකිවයුතු නිලධාරීන් හෝ පුද්ගලයන් හඳුනාගෙන ගත යුතු පියවරයන් ගෙන නොතිබුණි.

3.1.3 භාණ්ඩ සමීක්ෂණය
-----------------------
2013 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩලය මගින් ඌනතා ලෙස හදුනාගෙන ඇති භාණ්ඩ හා උපකරණ වල වටිනාකම තක්සේරු කර වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන ගත යුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය
-----------------------------------
2013 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| විධායක | 01 | 01 | | |
| ද්විතියික | 32 | 36 | | 04 |
| ප්‍රාථමික | 56 | 51 | 05 | |
| වෙනත් (අනියම්,තාවකාලික, කොන්ත්‍රාත්) | - | 04 | | 04 |
| | 89 | 92 | 05 | 08 |

සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා සඳහා රු.20,582,222 ක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂයේ වැටුප් හා සභික දීමනා ලෙස රු.16,705,600 ක මුදලක් වැයකර තිබුණෙන් සභා අරමුදලට රු.3,876,622 ක අතිරේක වැයබරක් වී තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-----------------------------------------
අයවැය පාලනය
------------------
සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අයවැය ලේඛන අනුව ඇස්තමේන්තුගත හා තථ්‍ය වියදම අතර විචලනයන් වූයෙන් අයවැය ලේඛනය සඵල මූල්‍ය පාලන කාරකයක් ලෙසට යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන
------------------------
පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය